# සිසුන්ගේ මෘදු කුසලතා සංවර්ධනය සඳහා සාහිත්‍යයෙන් ලැබෙන පිටුබලය : වර්තමානයේ පාසල්වල ක්‍රියාත්මක වන ප්‍රාථමික විෂය මාලාවේ අන්තර්ගත ළමාකතන්දර ඇසුරෙන්

නිර්මලා ජයසිංහ
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය
nirmalajayasingha7@gmail.com

**සාරසංක්ෂේපය**

සමස්ත මානව සංහතියේ ම ප්‍රගමනය උදෙසා අධ්‍යාපනයෙන් ලැබෙන්නේ මහගු පිටුබලයකි. ඒ අනුව එහි මුල් ම අඩියර වන ප්‍රාථමික අධ්‍යාපනය මානවයාගේ සමස්ත සංවර්ධනයෙහි ලා උපකාරී වන්නකි. විධිමත් සහ අවිධිමත් යන ප්‍රභේද ද්වය ඔස්සේ ලබන අධ්‍යාපනයෙන් ශිෂ්‍යයා දෘඪ කුසලතා මෙන් ම මෘදු කුසලතා ද අත්පත්කර ගනියි. දෘඪ කුසලතාවලින් සිසුවෙකුට ලැබෙන දැනුම ඵලදායී ලෙස භාවිත කිරීමටත්, අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ඵලදායී ලෙස මෙන් ම මනා සුසංයෝගයකින් යුතු ව අන්තර්ක්‍රියා සිදුකිරීමටත් අවශ්‍ය ගුණාංග ලැබෙනුයේ මෘදු කුසලතාවලිනි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ මෘදු කුසලතා වර්ධනය සඳහා අධ්‍යාපනයේ ජාතික අරමුණුවලින් මෙන් ම මූලික නිපුණතාවලින් ද අවධානය යොමු කර ඇත. 21වන සියවසෙහි අධ්‍යාපනය තුළ ද මෘදු කුසලතා සංවර්ධනය සඳහා ලබා දී ඇත්තේ සුවිශේෂ ස්ථානයකි. ඒ අනුව සැකසුණු ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාවෙන් සිසුන් වෙත මෘදු කුසලතා සම්ප්‍රේෂණය කරනු වස් සාහිත්‍යය මගින් ලබාදෙන්නේ මහගු පිටුබලයකි. ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව ද සාහිත්‍යය සමග අත්‍යන්තයෙන් බද්ධ ව පවතී. මේ පර්යේෂණයේ දී ප්‍රාථමික විෂය මාලාවේ ඇතුළත් ළමා කතන්දර 05ක් ඇසුරෙන් සිසුන්ගේ මෘදු කුසලතා සංවර්ධනය සඳහා ලබා දී ඇති ඉඩහසර කෙබඳු දැයි අධ්‍යයනයට පාත්‍ර විය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව සිදු කෙරෙන මෙම අධ්‍යයනයට අදාළ දත්ත රැස් කෙරුණේ ප්‍රාථමික විෂය මාලාවේ අන්තර්ගත ළමා කතන්දර විශ්ලේෂණයෙන්, තෝරා ගැනුණු පාසල් කිහිපයක ගුරුවරුන් හා දෙමව්පියන් සමග සිදුකෙරුණු සම්මුඛ සාකච්ඡාවලින් සහ ශිෂ්‍ය ක්‍රියාකාරකම් ප්‍රත්‍යක්ෂ ව නිරීක්ෂණය කිරීමෙනි. රැස්කරන ලද දත්ත විශ්ලේෂණය කිරීමෙන් එළඹුණු නිගමන වූයේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ළමාකතන්දර ඇතුළත් කිරීමෙන් සිසුන්ගේ රසඥතාව වර්ධනයට, නිර්මාණාත්මක කුසලතා වර්ධනයට, රංගන කාර්යයේ නිරත වීමට, සන්නිවේදන කුසලතා වර්ධනයට, යහපත් ආකල්ප වර්ධනයට විවේචනාත්මක හා විශ්ලේෂණ කුසලතා වර්ධනය වීමට මෙන් ම සමාජශීලීත්වය, ඉවසීම, නායකත්ව කුසලතා, සමාජචිත්තවේගීය කුසලතා වැනි මෘදු කුසලතා වර්ධනය වීමට ද එම කතන්දරවලින් සැලකිය යුතු පිටුබලයක් සැපයෙන බව ය.

**ප්‍රමුඛපද:** දෘඪ කුසලතා, ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව, මෘදු කුසලතා, සාහිත්‍යය, ළමාකතන්දර,

# Contribution of Literature for the Development of Soft Skills of Students: Based on Children's Stories in the Primary Curriculum Currently Implemented in Schools

Nirmala Jayasinha

Department of Early Childhood Development and Primary Education, National Institute of Education

nirmalajayasingha7@gmail.com

## Abstract

Education is a great support for the progress of the entire humanity. Thus, primary education, which is the first stage, is assisting in the overall development of the human beings. The student acquires hard skills as well as soft skills through formal and informal education. Soft skills are the qualities that a student needs to effectively use the knowledge gained from hard skills and to interact effectively and harmoniously in interpersonal communication. In Sri Lanka's education system, the national goals of education as well as the basic competencies have drawn attention to the development of soft skills. In the education of the 21st century as well, a special place has been given to the development of soft skills. Literature provides great support in imparting soft skills to the students through the accordingly prepared primary education curriculum. The primary education curriculum is also closely intertwined with literature. In this research, the opportunities provided for the development of soft skills of the students were examined in relation to the five children's stories included in the primary curriculum. Subject to qualitative research method, data were gathered through the analysis of children's stories included in the primary curriculum, interviews conducted with teachers and parents of the selected schools, and direct observation of student activities. The analysis of the collected data revealed that by including children's stories in primary education, assists in the development of students' tastefulness, creative skills, acting skills, communication skills, good attitude and critical and analytical skills as well as sociability, patience, leadership skills, and also the stories provide significant support for the development of soft skills such as social-emotional skills.

**Keywords:** Children's Stories, Hard Skills, Literature, Primary Education Curriculum, Soft Skills